# මැද හා පසු ළමා වියේ සංවර්ධනය (අවු 6-12 දක්වා)

ටී.ජී. රේබානි ලක්ෂිකා

## හැඳින්වීම

මිනිසා ළදරුවකු ලෙස උපත ලැබූ දින සිට මරණය දක්වා ජීවිතයේ විවිධ සංවර්ධන අවධි පසු කරමින් ගමන් කරයි. එනම් Newborn (උපතේ සිට පළමු මාසය දක්වා), Infant (පළමු මාසයේ සිට පළමු අවුරුද්ද දක්වා), Toddler (අවුරුදු 1 සිට අවුරුදු 2 දක්වා), Preschooler (අවුරුදු 2 සිට අවුරුදු 6 දක්වා), School-aged child (අවුරුදු 6 සිට අවුරුදු 12 දක්වා), Adolescent (අවුරුදු 12 සිට අවුරුදු 20 දක්වා), Young Adult (අවුරුදු 20 සිට අවුරුදු 40 දක්වා), Middle-aged Adult (අවුරුදු 40 සිට අවුරුදු 60 දක්වා), Young-old adult (අවුරුදු 60 සිට අවුරුදු 80 දක්වා), Old- old adult (අවුරුදු 80 සහ ඊට වැඩි) වශයෙනි (Kail and Cavanaugh, 2004).

පූර්ව ළමා විය (අවු. 2-6) එනම් පෙර පාසල් කාලය අවසන් වීමත් සමග ළමයෙකු මැද හා පසු ළමා වියට (අවු. 6- 12) පා තබනු ලබයි. ඒ අනුව මැද හා පසු ළමා විය (Middle and Late Childhood) යනු පෙර පාසල් විය (Preschooler Age) හා නව යොවුන් විය (Adolescence) අතර පවතින සංවර්ධනාත්මක අවධිය ලෙස හඳුනාගත හැකි වේ. මැද ළමා විය (Middle Childhood) වයස අවුරුදු 6-8 දක්වා කාල පරාසයට අයත් වන අතර පසු ළමා විය (Late Childhood) වයස අවුරුදු 9-12 දක්වා අතර කාල පරාසය තුළ විහිදී තිබේ. වයස අවුරුදු දොළහ තෙක් ළමයෙකු ලෙස කාලය ගත කරන දරුවා නව යෞවනයකු ලෙස සමාජය තුළ කටයුතු කිරීමට අවශ්‍ය පසුබිම සකස් කරනු ලබන්නේ මැද හා පසු ළමා විය තුළ දී ය. එසේම මැද හා පසු ළමා විය තුළ දී ළමයින් පුළුල් වූ භූමිකා සහිත ව නව පරිසරයකට ගමන් කරනු ලබන අතර නවමු සමාජ පරිසරයකට නිරාවරණය වීමෙන් ළමයින් ලබා ගන්නා අත්දැකීම් ඔවුන්ගේ පසුකාලීන කායික, මානසික හා සමාජමය ආදී සියලු පැතිකඩවල සංවර්ධනයට සෘජු දායකත්වයක් සපයයි. එම නිසා මෙම අවධිය ළමා

සංවර්ධනයේ තීරණාත්මක මෙන් ම වැදගත් අවධියක් ලෙස සැලකිය හැකි ය. මැද හා පසු ළමාවියේ සංවර්ධනය පිළිබඳ දැක්වීමේ දී එය මැද ළමා වියේ (Middle Childhood Development) සංවර්ධනය සහ පසු ළමා වියේ සංවර්ධනය (Late Childhood Development) ලෙස අවධීන් දෙකක් යටතේ අධ්‍යයනය කළ හැකි ය. ඒ අනුව එම තුළ දී සිදුවන ශාරීරික, චාලකල ප්‍රජානනික, සමාජීය සහ චිත්තවේග සංවර්ධනය යන පැතිකඩ ඔස්සේ වයස අවුරුදු හයේ සිට අවුරුදු දොළහ දක්වා කාලයේ දී ළමයෙකු තුළ සිදුවන සංවර්ධනය පිළිබඳ ව ගැඹුරු විග්‍රහයක යෙදිය හැකි ය.

**මැද ළමාවියේ සංවර්ධනය (අවු. 6-8)**

ළමා කාලයේ ස්වර්ණමය වයස (Golden age) ලෙස හැඳින්වෙන මැද ළමා කාලය ළමා සංවර්ධනයේ ඉතා වැදගත් සන්ධිස්ථානයක් වේ. මන්ද යත් ළදරු විය හා පූර්ව ළමා විය තුළ ළමයා පවුල තුළ වැඩි කාලයක් ගත කරමින් ඔවුන්ගේ ආදරය ලබමින් හැදී වැඩුණ ද තම සමීපස්ත පවුල් පරිසරයෙන් ඈත් ව වැඩි කාලයක් පාසලේ හා තම යහළුවන් සමග ගත කිරීමට ආරම්භ කරනුයේ මෙම අවධියේ දී ය. ඒ අනුව මෙම අවධිය පාසල් වයස (School age) ලෙස හැඳින්වෙන අතර අධ්‍යාපනයට වැදගත් තැනක් හිමිවේ. එහිදී ඔවුන්ට සමාජයට නිරාවරණය වීමට හා ලෝකය පිළිබඳ ව වැඩි වශයෙන් අත්දැකීම් ලබා ගැනීමට අවකාශය විවර වන අතර ළමයින් ඔවුන්ගේ අනන්‍යතාව තවදුරටත් මෙම අවධිය තුළ දී වර්ධනය කර ගැනීමට කටයුතු කරනු ලබයි. එසේ ම මැද ළමා වියේ දී ළමයි වැදගත් සංධිස්ථාන හතරක් කරා වැඩ කරති. එනම් පාසලට හැඩ ගැසීම, කියවීමට ඉගෙනීම වැනි තම අධ්‍යාපනික කුසලතා අත්පත් කර ගැනීම, සමවයස් මිතුරන් සමග සුහද ව කටයුතු කිරීමට ඉගෙන ගැනීම සහ සමාජ හෝ සංස්කෘතියට අදාළ නීති ඉගෙන ගැනීම යනාදිය වේ (Child and Youth Programs, Middle Childhood, n.d). මැද ළමාවියේ දී වාග්මාලාව, පරිකල්පනය, නිර්මාණශීලීත්වය සහ ස්වයං රැක බලා ගැනීමේ කුසලතා, චාලක කුසලතා වර්ධනය, සහයෝගයෙන් කටයුතු කිරීමට ඇති හැකියාව වර්ධනය, සාධාරණ ලෙස සෙල්ලම් කිරීමට ඇති හැකියාව වර්ධනය, නීති අනුගමනය කිරීමට ඇති හැකියාව, සාධාරණ චින්තනය සහ උපහාසය යන

පැතිකඩවල සුවිශේෂී වර්ධනය වීමක් සිදුවන බව පර්යේෂකයන් විසින් හඳුනාගෙන තිබේ. ඒ අනුව මෙම පැතිකඩවල සංවර්ධනය ශාරීරික, චාලක, ප්‍රජානනික, මානසික හා සමාජීය යන අංශ යටතේ පහත පරිදි හඳුනා ගත හැකි ය.

**ශාරීරික සංවර්ධනය (Physical Development)**

මැද ළමා වියේ ශාරීරික සංවර්ධනය පිළිබඳ සලකා බැලීමේ දී පූර්ව ළමාවියේ දී මෙන් සීඝ්‍ර කායික වර්ධනයක් පෙන්නුම් නො කරන අතර කායික වර්ධනය සෙමින් හෙවත් මන්දගාමී ව සිදු වේ. මෙම අවධිය තුළ සෑම වසරක දී ම ගැහැනු හා පිරිමි ළමයින් යන දෙපාර්ශවයේ ම බර කිලෝග්‍රෑම් 2-3ත් අතර ප්‍රමාණයකින් වැඩි වන අතර උස අඟල් දෙකකින් පමණ වර්ධනය වේ.

ළමයෙකුට වයස අවුරුදු හතේ දී පමණ ඔවුන්ගේ මොළයේ ප්‍රමාණය වැඩිහිටියකුගේ මොළයේ ප්‍රමාණයට ළඟා වේ. එසේ වුව ද වයස අවුරුදු හත වන විට මොළය සම්පූර්ණයෙන් ම වර්ධනය වන බව ඉන් ප්‍රකාශ නො වේ. මොළය වැඩිහිටියෙකුගේ මොළයේ ප්‍රමාණයට පත් වී වසර ගණනාවක් යන තුරු මොළය අඛණ්ඩ ව වර්ධනය වේ. දරුවන්ගේ කකුල් දිගු වන අතර පෙරට වඩා ශරීරය සමානුපාතික වේ. එමෙන් ම මැදි ළමා වියේ ආරම්භයේ දී මෙතෙක් ළමයින්ට තිබූ කිරි දත් හෙවත් තාවකාලික දත් වැටීමට ආරම්භ වේ. මෙම කිරි දත් මුඛය වර්ධනයට ළමයාගේ කතාවට වර්ධනයට, සිනහ වීමට, සැපීමට ඉතාමත් ම වැදගත් වන අතර අවුරුදු හයේ දී බොහෝ ළමයින්ගේ පළමු කිරි දත වැටීම සිදු වේ. ඒ අනුව මෙම අවධිය තුළ දී මුඛයේ මැද දත පළමු ව වැටෙන අතර ඉදිරි වසර හය තුළ අනෙකුත් දත් වැටීම හා ස්ථාවර දත් අලුතින් පැමිණීමට පටන් ගනී (Maricopa Community Collages, Middle Childhood).

මෙම අවධියේ දී ළමයෙකුගේ ශරීරයේ වර්ධනයට ආහාර, ජානමය සාධක, දේශගුණික තත්ව, ව්‍යායාම් සහ අසනීප යනාදිය ඍජුව ම බලපෑම් කරනු ලබයි. ඒ අනුව මැද ළමාවියේ දී දෙමාපියන් තම දරුවන්ගේ ආහාර රටාව, ශාරීරික ක්‍රියාකාරකම්, ව්‍යායාම්, සෞඛ්‍යමය තත්ව හා අසනීප පිළිබඳ ව සැලකිලිමත් වීම තුළින් ළමයින්ගේ කායික සංවර්ධනයට ධනාත්මක බලපෑමක් ඇති කළ හැකි ය.

## චාලක සංවර්ධනය (Motor Development)

ශාරීරික සංවර්ධනය මෙන් ම මැද ළමා වියේ දී සිදුවන චාලක සංවර්ධනය ද නව යොවුන් විය තුළ දී සාර්ථක ව කටයුතු කිරීමට සෘජු ව ම දායක වේ. මැද ළමා වියේ දී ශාරීරික සංවර්ධනය මන්දගාමී ව හෙවත් සෙමින් සිදු වීමේ ප්‍රතිඵලයක් ලෙස චාලක කුසලතා සංවර්ධනය වීම දැක්විය හැකි ය. ළදරු විය හා පූර්ව ළමා විය තුළ ක්‍රම ක්‍රමයෙන් පාට කිරීම, ලිවීම වැනි චාලක කුසලතා වර්ධනය වුවත් ඒවා වඩාත් විධිමත් ව හා පිළිවෙළට කිරීමට අවශ්‍ය කුසලතා තවදුරටත් සංවර්ධනය වීම මැද ළමා විය තුළ දී සිදු වේ.

සියුම් චාලක කුසලතා (Fine Motor Skills) ඉහළ මට්ටමේ පාලනයක් සහ නිරවද්‍යතාවක් අවශ්‍ය වන අතෙහි හෝ මැණික් කටුවෙහි කුඩා මාංශ පේශී හැසිරවීම මගින් සිදු කරනු ලබන ක්‍රියාකාරකම් සඳහා වැදගත් වේ. නිදසුනක් ලෙස ලිවීම, ගෑරුප්පුව හැසිරවීම දැක්විය හැකි ය. දළ චාලක කුසලතා (Gross Motor Skills) සමබරතාව, සම්බන්ධීකරණය, ප්‍රතික්‍රියා කාලය සහ ශාරීරික ශක්තිය සඳහා ශරීරයේ විශාල මාංශ පේශි භාවිත කරයි. දළ චාලක කුසලතා සංවර්ධනය වීම දිවීම, පැනීම වැනි විශාල මාංශපේශී චලන සිදුවන ක්‍රියාකරකම් සඳහා වැදගත් වේ. ඒ අනුව මැද ළමා වියේ දී දරුවන්ගේ සියුම් චාලක කුසලතා (Fine Motor Skills) හොඳින් සංවර්ධනය වී තිබෙන අතර එහි ප්‍රතිඵලයක් ලෙස ළමයාට දත් මැදීම, නියපොතු කැපීම වැනි තම පිරිසිදු භාවය පවත්වා ගැනීමට අදාළ කටයුතුවල නිරත වීමට හැකියාව ඇත. එමෙන් ම අක්‍රමවත් හැඩතල කැපීමට, පොත්වල රූල් මත කුඩා අකුරු ලිවීමට අදාළ කුසලතා සංවර්ධනය වීම මෙම අවධියේ දී සිදු වේ. එමෙන් ම ඔවුන්ට ඔවුන්ගේ නම් පිටපත් කිරීමට, සරල මෝස්තර ඇඳීමට, අකුරු සහ හැඩත, පිටපත් කිරීමට අවශ්‍ය චාලක කුසලතා මෙම අවධියේ දී සංවර්ධනය වේ. මෙම අවධියේ ළමයි චලනය හා සම්බන්ධ ක්‍රියාකාරකම් සඳහා බෙහෙවින් රුචිකත්වයක් දක්වන අතර ඔවුන් තුළ දිවීම, පැනීම පෙරළීම, නැටීම වැනි ක්‍රියාකාරකම් සඳහා අවශ්‍ය චාලක කුසලතාව වර්ධනය වී තිබේ. එසේ ම මෙම අවධියේ දී ඔවුන්ට තනි ව බයිසිකල් පැදීම වැනි විශාල මාංශ පේශී හා සම්බන්ධ වන ක්‍රියාකාරකම්වල නිරත වීමට අවශ්‍ය කුසලතා සංවර්ධනය වේ.

මැද ළමාවියේ ළමයි දළ චාලක කුසලතා භාවිත කිරීමට හා පුහුණු වීමට කාලය අවශ්‍ය වේ. විශාල ප්‍රදේශයක දිවීමට, එක පයින් පැනීමට පුරුදු වීම ඔවුන්ගේ පාලනය සහ ඔවුන්ගේ ශරීර අතර සම්බන්ධීකරණය වර්ධනය කිරීමට උපකාර කරයි. එම නිසා මැද ළමා විය තුළ දී දෙමාපියන් තම දරුවන් ව දළ චාලක කුසලතා සංවර්ධනය වීමට අදාළ ක්‍රියාකාරකම්වල (ක්‍රීඩාව, නර්තනය) නිරත කරවීම මගින් දරුවන්ගේ සංවර්ධනයට ධනාත්මක බලපෑමක් සිදු කළ හැකි ය.

## ප්‍රජානන සංවර්ධනය (Cognitive Development)

ළමා සංවර්ධනයේ ප්‍රජානන සංවර්ධනය හා වැදගත් ම අවධියක් ලෙස මැද ළමා විය දැක්විය හැකි ය. මන්දයත් භාෂා සංවර්ධනය, මතකය, හේතු දැක්වීම යනාදී ප්‍රජානනික හැකියාවන් රැසක් සංවර්ධනයට අවශ්‍ය අඩිතාලම මෙම අවධියෙන් ලැබීම හේතුවෙනි. ස්විස්ටලන්ත ජාතික මනෝ විද්‍යාඥයකු වන ජීන් පියාජේ (Jean Piaget) විසින් ළමයින්ගේ ප්‍රජානන සංවර්ධනය Cognitive Development Theory හෙවත් ප්‍රජානන සංවර්ධන න්‍යායෙන් ඉදිරිපත් කරනු ලබයි. ඒ අනුව මැද ළමා වියේ දී සිදුවන ප්‍රජානනික සංවර්ධනය එම න්‍යායයෙහි Concrete operational stage හෙවත් සංයුක්ත ක්‍රියාකාරී චින්තන අවධිය (අවු 7-11) තුළින් විග්‍රහ කරනු ලබයි. පියාජේ විග්‍රහ කරන ආකාරයට මෙම අවධියේ දී ළමයින්ට ඔවුන් සිතන ආකාරය පිළිබඳ ව වඩාත් හොඳ අවබෝධයක් තිබේ. එමෙන් ම මෙම අවධිය තුළ දී ළමයින්ගේ හේතු දැක්වීමේ කුසලතාව (Reasoning) සහ තර්කන කුසලතාව (Logical skill) වර්ධනය වීමට ආරම්භ වේ. එම නිසා ළමයින්ට හේතුව හා ප්‍රතිඵලය (ඵලය) අතර සම්බන්ධතාව පිළිබඳ ව වඩාත් හොඳ අවබෝධයක් තිබේ. මොවුන් තුළ තවමත් යම් තාක් දුරකට ආත්ම කේන්ද්‍රීය බවක් දක්නට ලැබුණ ද ඔවුන්ගේ ක්‍රියාවන් අනෙක් පුද්ගලයින්ට බලපාන්නේ කෙසේ දැයි අවබෝධ කර ගැනීමට පටන් ගනී. මෙම අවධියේ දී ළමයින්ගේ මතකය වර්ධනය වන අතර හැඩය, පාට, ප්‍රමාණය අනුව වස්තූන් කාණ්ඩවලට බෙදීමට හැකියාවක් ඇත. එසේ ම එකතු කිරීම, අඩු කිරීම, ගුණ කිරීම, බෙදීම තුළින් ගණිත ගැටලු විසඳීමට අවශ්‍ය ප්‍රජානන කුසලතා සංවර්ධනය වීම මැද ළමා විය තුළ දී සිදු වේ.

භාෂා සංවර්ධනය සහ වාග්මාලාව සංවර්ධනය පිළිබඳ ව සලකා බැලීමේ දී මෙම අවධිය තුළ දී ළමයි අලුතින් වචන ඉගෙන ගනිති. ඒ අනුව වයස අවුරුදු 8ක පමණ ළමයි දිනකට වචන විස්සක් පමණ කියවීම මගින් හෝ කියවන දේ වලට ඇහුම්කන් දීම මගින් ඉගෙන ගැනීම සිදු කරති. එසේ ම භාෂාවේ සරල ව්‍යාකරණ ඉගෙන ගැනීම මෙම අවධිය තුළ දී සිදු වන අතර දීර්ඝ හා සංකීර්ණ සංවාදවල නිරත වීමට අවශ්‍ය කුසලතා සංවර්ධනය වීම සිදු වේ. එමෙන් ම වයස අවුරුදු 8 දී පමණ ළමයින්ට චිත්තවේග ප්‍රකාශ කරමින් කතන්දර කීමට අවශ්‍ය ප්‍රජානන කුසලතා සංවර්ධනය වේ. තව ද සරල වට්ටෝරුවක් අනුගමනය කිරීමටල එදිනෙදා ජීවිතය පාදක කර ගනිමින් කතා ලිවීමට, කෙටි පණිවිඩයක් ලිවීමට අදාළ ප්‍රජානන කුසලතා සංවර්ධනය වීම මැද ළමාවියේ දී සිදු වේ (The Australian Parenting website, 2022).

**සමාජ චිත්තවේග සංවර්ධනය (Social- Emotional Development)**

මැද ළමා වියේ දරුවන් තම පවුල් පරිසරයෙන් ඈත් වී සමාජයේ විවිධ පුද්ගල කණ්ඩායම් සමග කටයුතු කිරීමට ආරම්භ කිරීම තුළ සමාජ සංවර්ධනයට අදාළ කුසලතා රැසකට අවශ්‍ය පසුබිම සැකසෙයි. එසේ ම විවිධ පුද්ගලයන් සමග කටයුතු කිරීමේ දී චිත්තවේග ප්‍රකාශ කරන ආකාරය, චිත්තවේග පාලනය, යාමනය කර ගන්නේ කෙසේ ද යන්න විධිමත් හැදෑරීමක් මෙම අවධිය තුළ දී සිදු වේ. ඒ අනුව වයස අවුරුදු හයේ සිට අට දක්වා දරුවන් පාසල් යාම ආරම්භ කිරීමත් සමග තම පවුලෙන් යම් තාක් දුරකට ඈත් ව ස්වාධීන ව කටයුතු කරන අතර ඔවුහු තම අනාගතය ගැන සිතීමට පටන් ගනිති. තව ද මිතුරන් සහ කණ්ඩායම් කෙරෙහි අවධානය යොමු කරන අතර ඔවුන්ගේ සම වයසේ මිතුරන් ඔවුන්ට රුචිකත්වයක් දක්වන්නේ ඔවුන් පිළිගන්නේ ද යන කරුණු පිළිබඳ ව වැඩි වශයෙන් සැලකිලිමත් වේ. මෙම අවධිය තුළ දී ළමයින් තමා කවුද යන්න පිළිබඳ ව, ඔවුන්ට කළ හැකි දේ මොනවා ද යන්න පිළිබඳ ව සහ ඔවුන්ට දැනෙන ආකාරය පිළිබඳ ව අවබෝධ කර ගන්නා අතර හරි වැරැද්ද කුමක් ද, තම වගකීම් යන ආදිය පිළිබඳ ව අවබෝධය ලැබේ.

සිග්මන් ෆ්‍රොයිඩ් විසින් ඉදිරිපත් කරනු ලබන Psychosexual stages හෙවත් මනෝ ලිංගික අවධි 5න් මැද ළමා විය latency හෙවත් නිලීන අවධියට අයත් වේ. මෙම අවධිය තුළ දී දක්වන පරිදි ළමයින්ගේ එතරම් ලිංගික සංවර්ධනයක් පෙන්නුම් නො කරන අතර ජීව විද්‍යාත්මක ප්‍රේරණ නිලීන තත්ත්වයක පවතී. එම නිසා ළමයින් යහළුවන් ඇති කර ගැනීම කෙරෙහි වැඩි අවධානයක් දක්වන අතර ඔවුන්ට යහළුවන් ඇති කර ගැනීමට හැකි වුව හොත් අභිමානයක් දැනේ. එසේ නොමැති වුව හොත් ඔවුන් හුදකලා වීම, ලැජ්ජාශීලී වීම යනාදී තත්ත්වයන්ට පත්වීම සිදු වේ. මෙම අවධිය තුළ දී බොහෝ විට ඔවුන් තමන්ගේ ලිංගිකත්වයට අදාළ සමවයස් කණ්ඩායම් සමග මිත්‍රත්වයක් ඇතිකර ගැනීමට පෙළඹවීම සිදු වේ. සමාජ සංවර්ධනය පිළිබඳ දැක්වීමේ දී ස්වයං සංකල්පය (Self-concept) ඉතා ම වැදගත් සාධකයකි. ස්වයං සංකල්පය ගොඩ නැගීමට දෙමව්පියන් පමණක් නොව ගුරුවරුන් යහළුවන් සහ ඔවුන්ගේ සම්බන්ධතා පවත්වන අනෙකුත් පුද්ගලයින්ගේ බලපෑම් හේතු වේ. ඒ තුළින් ලෝකය තුළ ඔවුන්ට හිමි ස්ථානය පිළිබඳ ව අවබෝධය ලබා ගනී (Maricopa Community Collage, Middle Childhood).

මෙම අවධියේ ළමයින්ගේ චිත්තවේග සංවර්ධනය සඳහා දෙමව්පියන්, යහළුවන්, ගුරුවරුන් හා අනෙකුත් සමාජ කණ්ඩායම් සමග තිබෙන සම්බන්ධතාවල ස්වභාවය ඍජු ව ම හේතු වේ. මෙම අවධියේ දී ළමයින් බොහෝ කාලයක් තම මිතුරන් සමග ගත කරන බැවින් ඔවුන්ගේ චිත්තවේග මිතුරන් සමග හුවමාරු කර ගැනීම සිදු වේ. යහළුවන් සමග විහිළු කිරීම මෙම අවධියේ දී දක්නට ලැබෙයි. පවුලෙන් ලැබෙන ධනාත්මක සහයෝගය, හොඳ යහළුවන් ලැබීම යනාදිය ළමයින් තුළ ධනාත්මක ගති ලක්ෂණ ඇති කිරීමට හේතු වේ. මෙම ධනාත්මක ව සහයෝගය තුළ සතුට, ආදරය, අභිමානය වැනි ධනාත්මක චිත්තවේග තවදුරටත් වර්ධනය වේ. මැද ළමා වියේ දී දෙමව්පියන්ගේ නිසි ආදරය රැකවරණය නොලැබීම, ගුරුවරුන්ගේ අප්‍රසාදයට ලක් වීම, සමවයස් පීඩනයට ලක් වීම, සමවයස් මිතුරන්ගෙන් හිරිහැරයට ලක් වීම තුළ ඍණාත්මක චිත්තවේග ආදිය වර්ධනය වේ. එතුළ තරහව, වෛරය, ඊර්ෂ්‍යාව වැනි චිත්තවේග අත්දකින අතර ඔවුන් හුදකලා වීම සිදු වේ. එසේ ම එහි ප්‍රතිඵලයක් ලෙස ඔවුන් ඍණාත්මක ක්‍රියාවල නිරත වන අතර

ඍණාත්මක සිතුවිලි ඇති කර ගැනීම, අන් අයට හානි කිරීම වැනි චිත්තවේගීමය තත්ත්වයන් අත් විඳී. එම නිසා මැද ළමා වියේ දරුවන්ගේ චිත්තවේග සංවර්ධනය සහ සමාජ සංවර්ධනය සඳහා දෙමාපියන්ගේ සහ ගුරුවරුන්ගේ නිසි මග පෙන්වීම මහෝපකාරී වේ.

**පසු ළමාවියේ සංවර්ධනය (අවු. 9-12)**

මැද ළමා වියෙන් පසුව ළමයා පසු ළමා වියට (අවු 9-12) එළඹෙන අතර නව යෞවනයෙකු ලෙස කටයුතු කිරීමට අවශ්‍ය ශක්තිමත් පසුබිම මෙම අවධිය තුළ ගොඩ නැගීම සිදු වේ. මෙම අවධිය තුළ දී ළමයි තුළ සාධන ප්‍රේරණය (Achievement Drive) ඉස්මතුවන බැවින් මෙය තීරණාත්මක අවධියක් (Critical Stage) ලෙස අධ්‍යාපනඥයන් විසින් හඳුන්වනු ලබයි. මනෝ විද්‍යාඥයින් විසින් මෙම අවධිය Gang Age, Age of Confirmity, Creative Age ආදී වශයෙන් ද හඳුන්වනු ලබයි. මෙම අවධිය තුළ දී ළමයා පාසල් පරිසරයට හොඳින් අනුවර්තනය වී තිබෙන අතර තාර්කික ව හා හේතු සහිත ව ලෝකය ගවේෂණය කිරීමට ආරම්භ කරනු ලබයි. පාසල් අධ්‍යාපනය ළමයාගේ ජීවිතේ ඉතා වැදගත් කොටසක් වන අතර ප්‍රාථමික අධ්‍යාපනය නිමා කර ද්විතීයක පාසල් අධ්‍යාපනය සඳහා පිය නැගීම සිදු වනුයේ පසු ළමා විය තුළ දී ය. එමනිසා විවිධ වූ අධ්‍යාපනික හා සමාජමය අභියෝගවලට මුහුණ දෙමින් ඒවාට හැඩ ගැසෙමින් ඉදිරියට ගමන් කරන්නා වූ සංවර්ධනාත්මක අවධියක් ලෙස පසු ළමා විය හඳුනාගත හැකි ය. ඒ අනුව මෙම අවධිය තුළ දී ළමයා සුවිශේෂී ශාරීරික වෙනස්කම්වලට බඳුන් වන අතර චාලක කුසලතාවන්ගේ සංවර්ධනය, සමාජ හා චිත්තවේගීමය සංවර්ධනයක් ද වන ආකාරය මෙම අවධිය තුළ දී හඳුනා ගත හැකි ය.

**ශාරීරික සංවර්ධනය (Physical Development)**

පසු ළමා විය නව යෞවන වියට පෙර අවධිය බැවින් නව යෞවන වියේ සිදු වන සුවිශේෂී වූ ශාරීරික වෙනස්කම් සඳහා ශරීරය සූදානම් කිරීම මෙම අවධිය තුළ දී සිදු වේ. මැද ළමාවිය තුළ දී ශාරීරික සංවර්ධනය මන්දගාමී ව සිදු වුව ද වැඩිවියට පත් වීමට පෙර සිදුවන වර්ධන වේගයේ ආරම්භය පසු ළමා විය තුළ දී සිදුවේ.

වර්ධන වේගය පිරිමි ළමුන් තුළ ආරම්භ වීමට ප්‍රථම ව ගැහැනු ළමුන් තුළ ආරම්භ වන අතර එය ගැහැනු ළමුන් තුළ සාමාන්‍යයෙන් වයස අවුරුදු 9-10 අතර කාලයේ දී සිදුවේ. පිරිමි ළමයින් තුළ වයස අවුරුදු 11-12 අතර කාලයේ දී වර්ධන වේගය ආරම්භ වීමට පටන් ගනී. එමනිසා මෙම අවධිය තුළ දී ගැහැනු ළමයි පිරිමි ළමයින්ට සාපේක්ෂ ව උසින් වැඩි වීම හඳුනා ගත හැකි ය.

ළමයින් වැඩි වියට පැමිණීම, පසු ළමා වියේ දී ආරම්භ වීම වේ. ගැහැනු ළමයින් තුළ වැඩි වියට පත් වීම සඳහා පිටියුටරි ග්‍රන්ථිය මගින් ඊස්ට්‍රජන් සහ ප්‍රොජෙස්ටරෝන් හෝර්මෝන නිෂ්පාදනය කරන අතර අවුරුදු 9 සිට 12 දක්වා කාලයේ දී එය ආරම්භ වේ. පිරිමි ළමයින් තුළ ටෙස්ටෙස්ටරෝන් හෝර්මෝනය නිපදවීම වයස අවුරුදු 11 සිට 14 දක්වා කාලය තුළ දී ආරම්භ වීම සිදු වේ (lowa State University, Middle and Late Childhood, n.d).

එසේ ම මෙම අවධියේ දී ළමයින් තුළ මාංශ පේශී වර්ධනය (Muscle Development) ශක්තිය වැඩිවීම, (Strength) සමබරතාව (Balance) සහ සම්බන්ධීකරණයේ (Coordination) ස්ථාවර වර්ධනයක් සිදු වේ. ළමයින් තුළ විශාල ශක්තියක් ගබඩා වී තිබෙන නිසා ඔවුහු ඉතා ක්‍රියාකාරී වෙති. එම නිසා ඔවුන් තුළ වැඩි වශයෙන් දඟඩිය දැමීම මෙම අවධිය තුළ දී හඳුනා ගත හැකි ය.

### චාලක සංවර්ධනය (Motor Development)

මැද ළමා වියේ දී දක්නට ලැබුණු චාලක කුසලතා තවදුරටත් සංවර්ධනය වීම පසු ළමා විය තුළ දී හඳුනා ගත හැකි ය. මෙම අවධිය තුළ දී සිදුවන මොළයේ වර්ධනය හා සම්බන්ධ ව චාලක කුසලතා වර්ධනය වේ. මාංශපේශී වර්ධනය, ශක්තිය වැඩි වීම සම්බන්ධීකරණ කුසලතා වර්ධනය වීම තුළ ළමයින්ට සංකීර්ණ චාලක ක්‍රියාකාරකම්වල නිරත වීමට හැකි වේ. මෙම අවධියේ ළමයින් තුළ වර්ධනය වී තිබෙන දළ චාලක කුසලතා සහ සියුම් චාලක කුසලතා පහත පරිදි වේ.

### දළ චාලක කුසලතා – Gross Motor Skills

- කණ්ඩායම් ක්‍රියාකාරකම්වල නිරත වීම (පාපන්දු, ක්‍රිකට්, ටෙනිස්) මෙම අවධියේ දී ළමයින්ට තම පාදය භාවිත කරමින්

බෝලයට පහර දීමට හැකි ලැබෙන අතර තනි අතින් බෝලය උඩ දමා ඇල්ලීම යනාදී චාලක කුසලතා වර්ධනය වී තිබේ.

- ඉතා හොඳින් පිහිනීමට හැකි වේ. මෙහි දී ජලය මත ශරීරය සමබර ව තබා ගැනීමට අවශ්‍ය කුසලතාව වර්ධනය වී තිබේ.
- එසේ ම ළමයින් තුළ ශාරීරික ක්‍රියාකාරකම් පිළිබඳ ඉහළ දැනුවත්භාවයක් පවතී.

එමෙන් ම මෙම දළ චාලක කුසලතා උපතින් ම පිහිටිය හැකි අතර නිරන්තර පුහුණු වීම් තුළින් තවදුරටත් වර්ධනය කර ගැනීමට හැකි වේ.

**සියුම් චාලක කුසලතා - Fine Motor Skills**

වැඩිහිටියන් භාවිත කරන මෙවලම් භාවිත කිරීමට ළමයින්ට හැකි ය. උදාහරණ ලෙස කියත, මිටිය ආදියෙන් වැඩ කිරීමට හැකි යග

- ළමයින්ට ලීවලින් සරල ව්‍යුහ තැනීමට මෙන් ම ඉදිකටුව නූල් භාවිතයෙන් සරල මැහුම් වර්ග කිරීමට හැකි ය.
- අඩු උත්සාහයකින් අකුරු ලිවීමට හැකි අතර ලිවීමේ වේගය ද මැද ළමා වියට වඩා වැඩි වේ.
- ඉරි (රූල්) රහිත කොළවල කෙලින් ලිවීමට හැකි ය (Youthrive Integrated Therapy Services, 9-12 years old Milestone, n.d).

චාලක කුසලතා පිළිබඳ දැක්වීමේ දී ගැහැනු ළමයින් සියුම් චාලක කුසලතා අවශ්‍ය ක්‍රියාකාරකම්වල නිරත වීමට දක්ෂ වන අතර පිරිමි ළමයි දළ චාලක කුසලතා අවශ්‍ය ක්‍රියාකාරකම්වල නිරත වීමට දක්ෂ වෙති. එසේ නමුත් නිසි පුහුණුව මගින් ළමයින්ගේ මෙම චාලක කුසලතා සංවර්ධනය කිරීමට හැකි වේ.

## ප්‍රජානන සංවර්ධනය (Cognitive Development)

මෙම අවධිය තුළ දී මැද ළමා වියට වඩා ළමයින්ගේ ප්‍රජානන හැකියා වර්ධනය වී තිබේ. මොළයේ ප්‍රදේශවල වර්ධනය මෙයට හේතු වන අතර වයස අවුරුදු 10-12 කාලයේ දී ලලාට ඛණ්ඩිකා ප්‍රදේශයෙහි හෙවත් Frontal lobes හි වර්ධනයත් සමග මතකය, තර්කනය, සැලසුම් කිරීම යනාදී ප්‍රජානන කුසලතාවල වර්ධනයක් සිදු වේ. එසේ ම පසු ළමා විය තුළ දී ළමයාට වම් හා දකුණු අර්ධ ගෝල භාවිත කරමින් ක්‍රියාකාරකම් සැලසුම් කිරීමට සම්බන්ධීකරණය කිරීමට හැකියාව තිබේ.

ජීන් පියාජේ විසින් ඉදිරිපත් කරන ලද ප්‍රජානන සංවර්ධනයේ අවධිවලින් සංයුක්ත ක්‍රියාකාරී චින්තන අවධිය මැද හා පසු ළමා වියට අයත් වේ. ඔහුට අනුව ළමයින්ට අදහස් හා අවස්ථා වඩා තාර්කික ව හා නම්‍යශීලී ව ඉදිරිපත් කළ හැකි ය. ඒ අනුව ඔවුන්ට සංස්ථිතිය (Conservation) පිළිබඳ ව අවබෝධය පවතී. නිදසුනක් ලෙස මිටි පළල වීදුරුවක තිබෙන ද්‍රව ප්‍රමාණය සිහින් උස වීදුරුවක තිබෙන ද්‍රව ප්‍රමාණයට සමාන වන බව අවබෝධ කර ගත හැකි ය. ළමයින්ගේ සිතීම වඩාත් තාර්කික හා සංවිධානාත්මක වුව ද තවමත් සංයුක්ත ස්වභාවයකින් යුක්ත ය. ළමයින්ට උද්ගාමී තර්කය භාවිත කර ලෝකය පිළිබඳ නිගමනවල එළඹීමට හැකි ය. එනම් යම් විශේෂ අවස්ථාවක් ගෙන එය සාමාන්‍ය තත්ත්වයට අදාළ කිරීම ය. එහෙත් ළමයින්ට නිගාමී තර්කනයේ යෙදීමට ප්‍රමාණවත් ප්‍රජානන සංවර්ධනයක් සිදු වී නොමැත.

එසේ ම ළමයින්ට ආපසු හැරවීමේ හැකියාව හෙවත් reversibility පිළිබඳ සංකල්පය අවබෝධ කරගත හැකි ය. එනම් ඉලක්කමක් හෝ වස්තුවක් වෙනස් කළ හැකි අතර නැවත ඒවා මුල් තත්ත්වයට ගෙන යා හැකි බවට තිබෙන අවබෝධය යි. උදාහරණ වශයෙන් 2+3 = 5 සේම 5-3 = 2 වේ යන්න අවබෝධ කර ගත හැකි ය (Advocates for Youth, Growth and Development, Ages Nine to Tweleve-What Parents Need to Know, n.d).

මෙම අවධියේ භාෂා හා වාග්මාලා සංවර්ධනය පිළිබඳ සලකා බැලීමේ දී තවදුරටත් නව වචන ඉගෙන ගන්නා අතර පහ ශ්‍රේණියේ

පමණ සිටින ළමයෙකු වචන 40,000 ක් පමණ දන්නා බව පර්යේෂණ මගින් පෙන්වා දෙයි. එමෙන් ම මෙම අවධිය තුළ දී සංකීර්ණ ව්‍යාකරණ ඉගෙන ගැනීමට හා ඒවා භාවිත කිරීමට ද හැකියාව තිබේ.

**සමාජ චිත්තවේග සංවර්ධනය (Social- Emotional Development)**

මෙම අවධියේ දී සමාජය සංවර්ධනය පවුල, සමවයස් කණ්ඩායම්, ගුරුවරුන් ආදී පිරිස් මූලික කර කර ගෙන සිදු වේ. බොහෝ විට ළමයින් සමවයස් පිරිස් සමග කණ්ඩායම් ගත ව කටයුතු කරන අතර කණ්ඩායම් තුළ ආහාර ගැනීම, කතා කිරීම හා ක්‍රීඩා කිරීම දක්නට ලැබේ. කණ්ඩායමකට අයත් ව කටයුතු කිරීම ඔවුන්ගේ සමාජ සංවර්ධනයට ඍජු ව ම හේතු වේ. මෙම කණ්ඩායම් තුළ කටයුතු කිරීමේ දී ළමයින් ඔවුන්ට ආවේණික වූ වචන භාවිත කරන අතර අනෙක් පුද්ගලයින්ගේ දෘෂ්ටිකෝණයෙන් යමක් දැකීමට අවශ්‍ය කුසලතාව අත්පත් කර ගනී.

එරික් එරික්සන් විසින් මිනිසා ළදරුවෙකු ලෙස උපත ලැබූ දා සිට මහලු විය තෙක් මනෝ සමාජීය සංවර්ධනය (Psychosocial development) අවධි අටක් ඔස්සේ සිදුවන බව පැහැදිලි කර ඇත. මැද හා පසු ළමා විය එහි සිව්වන අවධිය වේ. මෙම අවධිය වයස අවුරුදු 7 සිට 11 දක්වා පවතින අතර මෙහි දක්නට ලැබෙන මනෝ සමාජීය ගැටුම "සමත් භාවයට එරෙහි ව හීනමානය'' (Industry vs Inferiority) යන්න පැහැදිලි කර ඇත. ඔහු දක්වන්නේ සමාජ අන්තර්ක්‍රියා තුළින් ළමයින් ඔවුන්ගේ ජයග්‍රහණ හා හැකියා පිළිබඳ ව හැඟීමක් ඇති කර ගැනීමට පටන් ගන්නා බව ය. එය සමත්භාවය යි. හීනමානය යනු ළමයින්ට ඔවුන්ගේ හැකියා පිළිබඳ ව විශ්වාසයක් නොමැති වූ විට ජයග්‍රහණ ලබා ගැනීමට නො හැකි වූ විට දිරිගැන්වීම් නො ලැබුණු විට ඔවුන්ගේ හැකියා පිළිබඳ ව සැක කිරීම තුළ අත්විඳිනු ලබන තත්ත්වය වේ. පසු ළමා වියේ අධ්‍යාපනය තුළ දී ළමයි තරගකාරී විභාගවල මුහුණ දීම, නව විෂය හැදෑරීම, තරග සඳහා සහභාගි වීම වැනි විවිධ වූ අභියෝගවලට මුහුණ දෙති. මෙම අභියෝගවලට සාර්ථක ව මුහුණ දීමට හැකි වුව හොත් අභිමානයක් ඔවුන් තුළ වර්ධනය වන අතර නො හැකි වුව හොත් හීනමානය ඔවුන් තුළ වර්ධනය වේ. එම නිසා ළමයින් පරාජය ලබන අවස්ථාවල

දී ඔවුන් ව තවදුරටත් දිරිගැන්වීම ඉතාමත් වැදගත් වේ. එසේ ම මෙම අවධිය තුළ තිබෙන තරගකාරීත්වය නිසා ළමයින් ඔවුන්ව සංසන්දනය කිරීමට පටන් ගනී. එම සංසන්දනයේ දී ඔවුන් අන් අයට වඩා ඉහළින් සිටිය හොත් තමන් පිළිබඳ ව අභිමානයක් ඇති කර ගනිති. මෙම අවධියේ දී ළමයින් ව දිරිගැන්වීම ඔවුන්ගේ ස්ව සංකල්පය සංවර්ධනයට ද වැදගත් වේ.

මෙම අවධියේ ළමයින්ගේ සමාජ සංවර්ධනයට බලපානු ලබන තවත් සාධකයක් ලෙස හිරිහැර (Bullying) කිරීම හඳුනා ගත හැකි ය. ළමයින් බොහෝ විට සමවයස් මිතුරන්ගෙන් සහ වැඩිහිටියන්ගෙන් කායික, වාචික, මානසික හා ලිංගික වශයෙන් හිරිහැරයට පත් වීම තුළ හුදකලා වීම සිදු වේ. මෙය ළමයින්ගේ සමාජ සංවර්ධනයට හා ආත්ම සම්මානනයට සෘණාත්මක ව බලපායි. එම නිසා ළමයින් ව හිරිහැරයට ලක්වීම සහ හිරිහැර කිරීමට යාම වැළැක්වීමෙන් ඔවුන්ගේ සමාජ සංවර්ධනයට ධනාත්මක දායකත්වයක් සැපයිය හැකි ය.

මෙම සාධකවලට අමතර ව අද වන විට පසු ළමා වියේ දරුවන්ගේ සමාජ සංවර්ධනය සඳහා ප්‍රධාන ධාරාවේ මාධ්‍ය මෙන් ම සමාජ මාධ්‍ය ද සෘජු ව ම බලපෑමක් කරනු ලබයි.

මෙම අවධියේ ළමයින්ගේ චිත්තවේග සංවර්ධනය පිළිබඳ සලකා බැලීමේ දී මැද ළමා වියේ දී මෙන් ම චිත්තවේග අත්විඳීම සිදු වේ. පාසල් අධ්‍යාපනය තුළ විභාග ආදිය හා විෂය බාහිර ක්‍රියාකාරකම් කිරීමේ දී පවතින තරගකාරීත්වය, ජයග්‍රහණ ලබා ගැනීම වෙනුවෙන් කටයුතු කිරීම තුළ ළමයි තමන් ව අනිත් අය සමග සංසන්දනය කිරීම සිදු කරති. එතුළ තමා අනෙක් අයට වඩා ඉදිරියෙන් සිටින්නේ නම් ආඩම්බරය වැනි චිත්තවේග අත්විඳින අතර අනෙක් ළමයින්ට වඩා තමා පහළින් සිටින්නේ නම් තරහව, අනිත් අය කෙරෙහි ඊර්ෂ්‍යාව වැනි චිත්තවේග තවදුරටත් වර්ධනය වේ. ඒ අනුව මෙම අවධිය තුළ දී පොදුවේ අත්විඳින චිත්තවේග වනුයේ බිය, ඊර්ෂ්‍යාව, කුතුහලය, සෙනෙහස සහ ප්‍රීතිය වේ. සමහර විට ඔවුන් ආක්‍රමණශීලී විය හැකි අතර පහර දීමට ද යොමු වේ. අන් අය ව නොසලකා හැරීමල ඊර්ෂ්‍යාව පිළිබඳ හැඟීම් ප්‍රකාශ කිරීමේ තවත් පොදු ක්‍රමයකි. එසේ

ම ළමයින් ස්වාධීන ව කටයුතු කිරීමට රුචිකත්වයක් දක්වන බැවින් එයට බාධා වුව හොත් කෝපයට පත් වේග තමා නොකළ දෙයකට බනින විට හෝ දඬුවම් කරන විට කෝපයට පත් වේ. මෙම අවධියේ දී ගැහැනු ළමයින්ට වඩා පිරිමි ළමයි කෝපයට පත් වේ. එමෙන් ම චිත්තවේගීමය ප්‍රකාශන සංයමයෙන් යුතු ව ඉදිරිපත් කිරීමටත්, සෑම අවස්ථාවක දී ම ප්‍රචණ්ඩකාරී හැඟීම් ප්‍රකාශ නො කළ යුතු බවත් චිත්තවේග පාලනය කර ගනිමින් සුදුසු අවස්ථාවල දී ප්‍රකාශ කිරීමට ඉගෙන ගැනීම මෙම අවධිය තුළ දී සිදු වේ. එමෙන් ම මෙම අවධිය තුළ දී චිත්තවේගීමය බුද්ධිය වර්ධනය වී තිබීම නිසා ළමයින්ට තමන්ගේ චිත්තවේග මෙන් ම අනෙක් අය අත්විඳින චිත්තවේග අවබෝධ කර ගැනීමේ හැකියාව තිබේ (Life Span Development II School age and Adolescence, Emotional pattern of late childhood, 2011).

**සාරාංශය**

ඉහත සඳහන් පරිදි මැද හා පසු ළමා වියේ සංවර්ධනය ශාරීරික සංවර්ධනය, ප්‍රජානන සංවර්ධනය, චාලක සංවර්ධනය, චිත්තවේග සංවර්ධනය හා සමාජ සංවර්ධනය යන පැතිකඩ තුළින් හඳුනාගත හැකි ය. මැද ළමාවියේ සංවර්ධනය තුළ දී ශාරීරික සංවර්ධනය තුළ සුවිශේෂී වර්ධනයක් දක්නට නොලැබුණ ද චාලක සංවර්ධනය ප්‍රජානන සංවර්ධනය තුළ සුවිශේෂී ලක්ෂණ හඳුනා ගැනීමට හැකි වේ. එසේම සමාජ හා චිත්තවේග සංවර්ධනයේ දී ළමයා ඇති කර ගනු ලබන විවිධ සමාජ සබඳතා තුළින් චිත්තවේග නියාමනයෙහි ලබන පුහුණුව මෙහි දී කැපී පෙනේ. ඒ අනුව මැද ළමාවියේ දී විවිධ අංශයන්ගෙන් ළමයා තුළ සිදුවන සංවර්ධනය පසු ළමාවියේ දී සිදුවන සංවර්ධනය සඳහා ශක්තිමත් අඩිතාලමක් සපයනු ලබයි. මැද ළමා වියෙහි මෙන් නොව පසු ළමා වියෙහි ගැහැනු හා පිරිමි ළමුන්ගේ ශාරීරික සංවර්ධනය සීඝ්‍ර වර්ධනයක් පෙන්නුම් කරන අතර දෙපාර්ශවයෙහි ම ප්‍රජනන හෝර්මෝන නිපදවීම ආරම්භ වීම එහිදී දක්නට ලැබෙන සුවිශේෂී කරුණකි. දළ චාලක කුසලතා හා සියුම් චාලක කුසලතා වර්ධනය වීම තවදුරටත් සිදුවන අතර සුවිශේෂී ප්‍රජානන කුසලතාහි වර්ධනයක් දක්නට ලැබේ. සමාජ හා චිත්තවේග සංවර්ධනය තුළ දී තරගකාරීත්වය තුළ කටයුතු කිරීම, පුළුල් වූ සමාජ සබඳතා පැවැත්වීමට ළමයින් ඉගෙන ගන්නා ආකාරය හඳුනා ගත

හැකි ය. ඒ අනුව යහපත් දෙමාපියභාවය, ගුරුවරුන්ගේ නිවැරදි මග පෙන්වීම, ධනාත්මක පාසල් පරිසරය හා හිතකර සමාජ කණ්ඩායම් තිබීම මැද හා පසු ළමා වියේ සංවර්ධනය ධනාත්මක ලෙස සිදුවීමට වැදගත් වේ.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය

Advocates for Youth (n.d) Available at: https://www.advocatesforyouth.org/resources/health-information/parents-15/ (Accessed: October 16, 2022).

Child and Youth Programms (n.d) *Middle Childhood (Ages 6-12)* Availale at https://www.gov.mb.ca/healthychild/mcad/middle.html#:~:text=Middle%20childhood%20is%20a%20stage,to%20develop%20their%20own%20identity (Accessed: October 16, 2022).

Craig, G. and Baucum, D. (1999). *Human Development*. Londan:Prentice-Hall International (UK) Limited

Kail, T. and Cavanaugh, J. (2004). *Human Development A Life- Span View*. 3rd ed. USA: Wardsworth/ Thomson Learning

*Life Span Development* (n.d) Periods of Development | Available at :https://courses.lumenlearning.com/suny-lifespandevelopment2/chapter/periods-of-development/ (Accessed: October 16, 2022).

*Life Span Development II School Age and Adolescence* (2011) Available at:http://ecoursesonline.iasri.res.in/mod/page/view.php?id=24314 (Accessed: October 16, 2022).

Lowa State University (n.d) Available at: https://iastate.pressbooks.pub/parentingfamilydiversity/chapter/middle-and-late-childhood/ (Accessed: October 16, 2022).

Maricopa Community Colleges (n.d) Available at: https://open.maricopa.edu/devpsych/chapter/chapter-6-middle-childhood/ (Accessed: October 16, 2022).

Raisingchildren.net.au/ The Australian Parenting website. (2022). Available at: https://raisingchildren.net.au/school-age/development/development-tracker/6-8-years (Accessed: October 16, 2022).